# ජාතික සංකේත

සෑම රටකම තමන්ටම ආවේණික වූ ඉතිහාසයක්, ජාතියක්, ආගමක් පවතී. ඔවුහු තම අනන්‍යතාව පවත්වා ගැනීමටත් ප්‍රෞඪත්වය කියා පෑමටත් එකිනෙකාට ආවේණික වූ ජාතික සංකේත භාවිත කරති.





ජාතික කොඩිය හෙවත් ධජය
ජාතික ගීය
රාජ්‍ය ලාංඡනය
ඒ අතරින් ප්‍රධාන වේ.

## ශ්‍රී ලංකා ජාතික කොඩිය

ජාතික කොඩිය හෙවත් සිංහ කොඩියෙන් රටෙහි සමස්ත ජනතාව නියෝජනය වන අංගලක්ෂණ එම ජාතීන්ගේ අරමුණු, ප්‍රාර්ථනා, සාරධර්මද නිරූපණය වේ.

(C) Sumitha Publishers

## සිංහ කොඩියේ ඉතිහාසය.

ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට ධජයක් පිළිබඳව සටහනක් හමු වන්නේ ක්‍රි.පූ. දෙවන ශත වර්ෂයේ දීය. ඒ දුටුගැමුණු - එළාර සටනේදී සිංහල රජුගේ සේනාව සිංහල ලාංඡනය සහිත කොඩියක් රැගෙන ගිය බවයි.

එම කොඩිය යුද පිටියට ගෙන යන ආකාරය කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසින් දඹුලු රජ මහා විහාරයේ සිතුවම් කර ඇත.



# ජාතික කොඩියේ නිර්මාණය



ශ්‍රී ලංකාව 1815 දී බ්‍රිතාන්‍යයන්ට යටත් වීමත් සමගම, ඔවුහු අපගේ කොඩිය එංගලන්තයට ගෙන ගියහ. නිදහස් සටනේ ඇරඹුමත් සමගම අලුත් කොඩියක් නිර්මාණය කිරීම වෙනුවට බ්‍රිතාන්‍යයන් සඟවා ගත් කොඩිය සොයා ගැනීමට හැකි විය. ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ රාජකීය ධජයේ සංශෝධන සහිතව ප්‍රථම වරට 1952 පෙබරවාරි 4 වැනි දින නිදහස් උලෙළ දා වර්තමාන ජාතික කොඩිය ඔසවන ලදි.

(C) Sumitha Publishers

## ජාතික කොඩිය නිර්මාණය කළ සාමාජිකයෝ



එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක (සභාපති)



මහාචාර්ය සෙනරත් පරණවිතාන (ලේකම්)



ශ්‍රීමත් ජෝන් කොතලාවල



ශ්‍රීමත් ලලිත් රාජපක්ෂ



ටී.බී. ජයා



ජී.ජී. පොන්නම්බලම්



ජේ.ආර්. ජයවර්ධන